# අභයගිරි ආරාම සංකීර්ණය ආශ්‍රිතව හඳුනාගත හැකි උරුම කළමනාකරණ ගැටළු

බී.එම්.එම්. බණ්ඩාර

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
basnayakamadusanka@gmail.com

**ප්‍රමුඛ පද:** පුරාවිද්‍යා උරුමය, අභයගිරි ආරාම සංකීර්ණය, පුරාවිද්‍යාත්මක

## හැඳින්වීම

ඕනෑම රටක ස්වකීය අනන්‍යතාවය ඉස්මතු කරනු ලබන ප්‍රධාන සාධකය වන්නේ උරුමය යි. යුගයන් ගණනාවක් නියෝජනය කරන එකී උරුමය කාලය හරහා ගමන් කිරීමේ දී ඒ ඒ යුගයන්වල සිදු වූ දේශපාලනික, ආර්ථික, ආගමික මෙන්ම සාමාජීය සංස්කෘතික සාධකයන් තැන්පත් වූ පොදු වස්තුවක් බවට පත්වේ. ඒ අනුව උරුමය අතීත මානව වර්ගයාගේ පැවැත්ම ක්‍රියාකාරකම් පිළිබඳ ව කියැවෙන මූලික වාර්තාවක් ද වේ.

සැබැවින්ම යම්කිසි රටක යටගියාව වර්තමානයට අදාල වනසේ ගැලපීම, ගොඩනගන ඉතිහාසය ද්‍රව්‍යමය සංස්කෘතිය හරහා අනාගතයට ඉදිරිපත් කිරීම හා පවත්වාගෙන යාම අතිශය බැරෑරුම් කටයුත්තකි. විශේෂයෙන්ම ජනවාර්ගික අර්බුද, ජාතිභේද, ආගමික මතවාද පවතින ශ්‍රී ලංකාව වැනි රටක උරුමය, ඉතිහාසය, පුරාවිද්‍යාව අධ්‍යයනය කිරීම සහ අර්ථ දැක්වීම සුපරීක්ෂාකාරීව සිදුකල යුත්තකි. තම පටු අරමුණු සාධනය කරගනු පිණිස ඓතිහාසික ස්ථාන, චරිත, සිද්ධි, පුරාවිද්‍යාත්මක අවශේෂ හා බැඳුනු පොදු උරුමය ඉතාම සියුම් ලෙස උපයුක්ත කරගැනීම එයට හේතුවයි.

වර්තමාන ශ්‍රී ලංකාවේ සංස්කෘතික, ආගමික, දේශපාලනික මෙන් ම ආර්ථික පරමාර්ථ සාධනය කරගැනීමට යාමේ දී උරුමය බහුල ලෙස යොදා ගැනීමට පෙළඹීම හා පෙළඹවීම බරපතල උරුම ව්‍යසනයක් දක්වා සංවර්ධනය වී ඇත. එහි ඵලය නම් ස්වකීය අනන්‍යතාවය සංකේතවත් වන උරුමය ආරක්ෂා කරගැනීම, පවත්වාගෙනයාම, කළමනාකරණය ආදිය සමාජගත වූ ගැටළුවක් දක්වා පැමිණීමයි.එහි අහිතකර බලපෑම මෙ රට අභිමානයට හා පෞඩත්වය කෙරෙහි ඍජුව බලපෑම් කරනු ලබන අතර අඛණ්ඩ ඉතිහාසයකට උරුමකම් කියන පුරාවස්තු හා ස්මාරකයන් ඉතා ඉක්මනින් හායනයට පත් වීමට ද එය ප්‍රබල සාධකයක් වෙයි.ඒ අනුව මෙම කරුණු මත පිහිටමින් සිදු කරනු ලැබූ මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටළුව වූයේ වර්තමාන ලාංකීය සමාජය කෙරෙහි පුරාවිද්‍යාත්මක උරුමයන්හි පවතින වටිනාකම කෙබඳු ද? යන්න සොයා බැලීම හා දැනට සිදු කරණු ලබන පුරාවිද්‍යාත්මක උරුම සංරක්ෂණය කිරීමේදී උද්ගතව ඇති ගැටළු මොනවාද? යන්න පිළිබඳ ව අධ්‍යයනය කිරීමය.මෙහිදී පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වූයේ දැනට මෙම ආරාම සංකීර්ණය හා සම්බන්ධ තදාශ්‍රිත ප්‍රදේශයේ දේශපාලනික, ආගමික ආර්ථික, සංස්කෘතික හා සමාජීය පසුබිම අධ්‍යයනය කිරීම මඟින් ලාංකීය පුරාවිද්‍යා උරුමයන්හි පවතින වටිනාකම හඳුගැනීමට හා ඒ ආශ්‍රිත ව දැනට සිදුකර ඇති පුරාවිද්‍යා සංරක්ෂණ ක්‍රියාවලින්

අධ්‍යයනය කිරීම මඟින් වර්තමානයේ උද්ගතව ඇති පොදු පුරාවිද්‍යාත්මක උරුමය සම්බන්ධව ඇති ගැටළු හඳුනාගැනීමය.

## ක්‍රමවේදය

පර්යේෂණ සීමාව ලෙස තෝරා ගත් එක් ස්ථානයක් ආශ්‍රයෙන් මේ පිළිබඳව අධ්‍යයනය කිරීමට යොමු වූ අතර ඒ සඳහා අනුරාධපුර අභයගිරි ආරාම සංකීර්ණය අශ්‍රිත ව දැනට සිදු කර ඇති උරුම සංරක්ෂණයන් පිළිබඳ අධ්‍යයනය කිරීමට යොමු විය.මෙම සීමාව යටතේ පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේදී සාහිත්‍යය මූලාශ්‍රය පරිශීලනයෙන් පසු සමාජවිද්‍යා අධ්‍යයනවල දත්ත රැස් කිරීම සඳහා භාවිතා කරනු ලබන ගුණාත්මක හා සංඛ්‍යාත්මක දත්ත රැස් කිරීමේ විධික්‍රම භාවිතා කළ අතර එහිදි නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, කේවල අධ්‍යයන ආදි ක්‍රමවේද භාවිත කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙසේ රැස් කර ගන්නා ලද දත්ත විශ්ලේෂණය කිරීම මඟින් අභයගිරි සංකීර්ණයට අයත් උරුමය ප්‍රධාන වශයෙන් ඓතිහාසිකමය, සෞන්දර්යාත්මක,භාවමය, සාමාජීය, විද්‍යාත්මක හා තාක්‍ෂණික ආදි වූ වටිනාකම්වලින් යුක්ත වන බව හැදිනගත හැකිය.ඒ අනුව මෙම විහාර සංකීර්ණයේ ඓතිහාසිකමය වශයෙන් ඇති වටිනාකම අනුරාධපුර යුගයේ මුල් කාලය දක්වා දිව යන බව පැහැදිළි වේ.මහාවංසය ආදී සාහිත්‍යය මූලාශ්‍රයන්ට අනුව ක්‍රි: පූ 89-77 කාලය තුළදී වළගම්බා රජු විසින් ඉදිකරන ලද මෙම විහාර සංකීර්ණය මෙර ට බෞද්ධ සම්ප්‍රදායේ පළමු නිකාය භේදය ඇති වීමට බලපෑම් කරන ලද ප්‍රථම පෞද්ගලික ආරාම පූජාව සිදු වූ ස්ථානය වශයෙන් ඓතිහාසිකමය වැදගත්කමකින් ද යුක්ත වේ.

මේ හැරුණු විට අභයගිරි විහාර සංකීර්ණය සෞන්දර්යාත්මක අගය අතින් ද වැදගත්කම් රාශියක් පවතින බව අනාවරණය විය. එහිදි පූජනීයත්වය සංකේතවත් කරන ලබන ස්ථූප, ප්‍රතිමා, උපෝසථාඝර, ධර්මශාලා ආදි විහාරංග ආදියෙන් නිර්මිත කලාත්මක අංගයන් මෙහිදි දැක ගත හැකි වෙන අතර ඒ අතරින් ජල පොකුණු, සඳකඩ පහණ, මුරගල්, කොරවක් ගල්, පියගැට ආදි වූ නිර්මාණ වඩාත් වැදගත් කලාත්මක නිර්මාණ ලෙස හඳුනාගත හැකි ය.තවද ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සුන්දරත්වයෙන් අනූන පොකුණු කිහිපයක්ම අභයගිරිය ආශ්‍රිතව දක්නට ඇත. කුට්ටම් පොකුණ, ඇත් පොකුණ ඒ අතර විශේෂ වෙයි. මෙම භූමියේ පවතින සාමාජික අගය පිළිබඳ ලද තොරතුරු අනුව අභයගිරි ආරාම සංකීර්ණය විවිධ අංශයන් ඔස්සේ සාමාජීය පුද්ගලයින්ගේ ඇඟයීමට ලක් වන පුරාභූමියක් ලෙස හඳුනාගැනිනි. එහිදි ඓතිහාසික උරුමයක්; පූජනීය වස්තුවක්, විශ්මිත නිර්මාණයක්, මෙන්ම ජගත් උරුමයක් ලෙස ජාතික හා ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානය මේ කෙරෙහි ලක් වී තිබේ.මේ නිසා එය දැක බලා ගැනීමට වැදපුදාගැනීමට පැමිනෙන්නන්හට මහත් ආශ්වාදයක් ඒ හරහා ලැබෙයි.එය සාමාජීය අතින් මහත් වටිනාකමක් වන අතර මෙවන් අවස්ථාවන්හි දි අදාළ උරුම භූමියට ආපදාවක් නොවීමට වගබලා ගැනිම මතුපරපුර වෙනුවෙන් සිදුකළ යුතු ව පවතින යුතුකමක් ලෙස මෙහිදි තහවුරු විය.

ජගත් උරුමයක් ලෙස ජාතික හා ජාත්‍යන්තර වශයෙන් බොහෝ දෙනෙකුගේ සජීවී දර්ශනයට වර්තමානයේ අභයගිරි ආරාම පරිශ්‍රය නතු වන බව මෙම අධ්‍යයනය තුළින් තහවුරු විය. භික්ෂූන්වහන්සේලා, පුරාවිද්‍යා නිලධාරීන්, ආරක්ෂක අංශය, සාමාන්‍යය ජනතාව, සංචාරකයන්, වාණිජ ජනතාව, අභිකුණ්ඨක ජනයන්, හිඟන්නන්

ආදි වූ සමාජයේ විවිධ පිරිස් අභයගිරි සංකීර්ණය භාවිත කරන්නන් අතර වෙයි.මෙහිදී අදාළ උරුම භූමිය සම්බන්ධව ඒ ඒ පිරිස තුළ ඇති දැනුමෙහි ස්වාභාවය මත විවිධ කෝණයන්ට අනුව යමින් උරුම භූමිය පරිහරණය කිරීමට යොමුවන බව ලත් තොරතුරු අනුව අනාවරණය වූ අතර මේ හේතුවෙන් වර්තමානය වන විට ජගත් උරුම කලාපයක් තුළ පිහිටා ඇති අභයගිරි ආරාම සංකීර්ණය ප්‍රබල උරුම අභියොගයන්ට ලක් වූ ස්ථානයක් ලෙස හඳුනාගැනීමට මෙමගින් හැකියාව ලැබුණි.ඒ අනුව වර්තමානය වන විට මෙම ආරාම සංකීර්ණය ආශ්‍රිත ව උද්ගත ව ඇති උරුම කළමනාකරණ ගැටළු කිහිපයක් ප්‍රධාන වශයෙන් හඳුනාගැනීමට හැකි විය.ඒ අතර නරඹන්නා කළමනාකරණය නොකිරීම,භෞතික හා මානව සම්පත්වල හිඟය,උරුම ස්ථාන නඩත්තු නොකිරීම,දේශපාලන ආගමික හා සාමාජික බලපෑම්,මානව හා සත්ත්ව පලිබෝධන, ස්ථාන අර්ථ නිරූපණ දුර්වලතා, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, සංචාරක අංශයේ අකාර්යක්ෂමතාව, මාර්ගෝපදේශනයේ දුර්වලතා ආදි වූ ගැටළු වර්තමානයේ මෙම උරුමයන් ආශ්‍රිතව උද්ගතව ඇති ප්‍රධාන කළමනාකරණ ගැටළු ලෙස පෙන්වා දිය හැකිය. මෙම ගැටළු හේතුවෙන් වර්තමානයේ මෙම ආරාම සංකීර්ණයේ උරුමයන් බොහෝ ප්‍රමාණයක් විනාශයට පත් වී ඇති අතර දිනෙන් දින විනාශයට පත් වෙමින් පවතින බව අවබෝධ විය. එසේ හෙයින් මේ සඳහා ගත හැකි සුදුසු ක්‍රියාමාර්ගයන් ලෙස, උරුමයන්ට සිදු වන මෙම හානිය වළක්වමින් මෙම ගැටළු නිසි ආකාරව පාලනය කිරීම සඳහා නව උරුම කළමණාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු ව පවතින බවට තහවුරු කළ හැකි අතර පෞඪ ඉතිහාසයක තොරතුරු හෙළි වන මෙම ස්ථානයේ උරුමය නිසි අයුරින් සංරක්ෂණ කිරීමේ ඇති වැදගත් කම පිළිබඳ ව දැනුවත් ව එය විනාශ මුඛයෙන් ගලවා ගැනීම වර්තමාන වගකිව යුත්තන්ගේ යුතුකමක් ව පවතින බවට අවධාරණය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


මහාවංශය **සිංහල** (2007) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. ඇන්ඩසන් පාර. නැදිමාල. දෙහිවල.

කුලතුංග ටී.ජී. (2004) **අභයගිරි පර්යේෂණ.** මධ්‍යම සංස්කෘතික අරමුදල. රජයේ මුද්‍රණාලය. කොළඹ 08.

ක්ෂේත්‍ර සමීක්ෂණය. තෙදින අධ්‍යයන වැඩමුළුව (2016) ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුම කළමණාකරණය පිළිබඳ නව සැලැස්මක් (අභයගිරි ආරාම සංකීර්ණය ඇසුරින්). ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. හෝමාගම.